සබරගමුව පළාත් සභාව – சப்ரகமுவ மாகாண சபை – Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு**

**Ministry Of Education, Information Technology & Cultural Affairs**

***Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry***

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/2(සබර/චක්‍රලේඛ) | ඔබේ අංකය<br>உமது இல<br>Your Numbe | | දිනය<br>திகதி<br>Date | 2014.06. 04 |

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**
**: සබර/2014/18**

සබරගමුව පලාත් සභා
සියළුම විදුහල්පතිවරුන් වෙත,

## ඩෙංගු මදුරු ව්‍යාප්තිය පාලනය කිරීම

මෙම වර්ෂයේ,ඩෙංගු මදුරු ව්‍යාප්තිය වැඩිවීම හේතුවෙන් ඩෙංගු රෝගීන් විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇත. එමෙන්ම වෙනත් වර්ෂ වලට වඩා ඩෙංගු රෝගය හේතුවෙන් ජීවිත හානිද සිදුවී ඇත. පාසල් දරුවන් රැසක්ද ඩෙංගු රෝගයට ගොදුරුවීම හේතුවෙන් දින කීපයක් රත්නපුර කලාපයේ පාසල්ද වසා දැමීමට සිදුවිය.

02. එමෙන්ම,මේ වන විට ඩෙංගු මදුරුවාගේ ජීවන චක්‍රයද වෙනස්වී මුළු දවස පුරාම මදුරුවා සක්‍රියව සිටින බවත්, අපිරිසිදු ජලයේ පවා මෙම මදුරුවා බෝවෙන බවත් සෞඛ්‍ය විශේෂඥයින් විසින් සොයා ගෙන ඇති බව වාර්තා වේ. එබැවින්, දැනට වසංගත තත්ත්වයක් බවට පත් වෙමින් පවතින මෙම ඩෙංගු මදුරු ගහනය පාලනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් විදුහල්පතිවරු විසින් ආරම්භ කල යුතුය. ඒ සඳහා පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස මින් දන්වා සිටිමි.

1) සතියේ එක් දිනයක එක් කාල පරිච්ඡේදයක් ඩෙංගු මර්ධනය සඳහා ශ්‍රමදානයක් පාසලේ සිසුන් , දෙමව්පියන් හා ගුරුවරුන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීම.

2) මෙම වසංගත තත්ත්වය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම් නිරන්තරයෙන් සිදු කිරීම.

3) පලාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, නගර සභා, ප්‍රාදේශීය සභා සඳහා අවශ්‍ය සහයෝගයන් ලබාදීම.

4) මේ පිළිබඳව දෙමව්පියන් දැනුවත් කිරීම, තම නිවාස පරිශ්‍රය අවට මදුරුවන් බෝ වෙන ස්ථාන විනාශ කර පිරිසිදුව පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

5) පාසලේ මෙම කාර්යයන් සඳහා විෂයභාර ගුරුවරයකු /නියෝජ්‍ය විදුහල්පතිවරයකු පත්කිරීම හා ඒ පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම.

6) මේ සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල වලින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර.

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් 01. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි.
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ -දැ.පි.
03. පළාත් පාලන කොමසාරිස් - දැ.පි.
04. නාගරික කොමසාරිස් - දැ.පි.
05. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු - දැ.පි.
06. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර / කෑගල්ල -දැ.පි.
07. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු -දැ.පි.